www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප ලේකම්ගෙන් එජාපෙ ආන්ඩුවේ ආයාචනයකට පිලිතුරක්

**Sri Lankan SEP replies to an appeal from ruling class**

2004 මාර්තු 12

*අප්‍රේල් 2 දා ශ්‍රී ලංකාවේ පැවැත්වෙන මැතිවරනයේ දී දක්ෂිනාංශික එක්සත් ජාතික පෙරමුනේ (එජාපෙ) ප්‍රමුඛ අපේක්ෂකයකු වන මිලින්ද මොරගොඩ විසින් ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත ඊ-මේල් මගින් එවන ලද ආයාචනයක් ද සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ප්‍රධාන ලේකම් විජේ ඩයස් එයට දුන් පිලිතුර ද පහත පල වේ. ප්‍රමුඛ බැංකුකරුවකු වන මොරගොඩ, එජාපෙ ආන්ඩුවේ ආර්ථික ප්‍රතිසංස්කරන, විද්‍යා හා තාක්ෂන ඇමති වූ අතර දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග පැවති සාකච්ඡාවලට සහභාගි වූ ආන්ඩුවේ නියෝජිත කන්ඩායමට ද ඇතුලත් විය. කොලඹ දිස්ත්‍රික්කයට තරග වදින සසප අපේක්ෂක කන්ඩායමට නායකත්වය දෙන විජේ ඩයස්, ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකි.*

**මිලින්ද මොරගොඩගේ ආයාචනය:**

හිතවත් මිතුරනි,

අද අප මුහුන දී සිටින්නේ අනවශ්‍ය මැතිවරනයකට ය. එම මැතිවරනය කඩාපාත් වී ඇත්තේ, මහජනතාවගේ උවමනාවන්ට වඩා බල ලෝභයට මුල් තැන දීම හේතු කොටගෙන ය. මීට දෙවසරකට ඉහත දී මා දේශපාලනයට පැමිනියේ, දේශපාලන ක්‍රමයේ සංස්කෘතිය වෙනස් කිරීමට සහාය දීමේ ප්‍රයත්නයට ය. එහෙත් දැන් තත්වය තිබුනාටත් වඩා නරක් වී ඇති බවක් පෙනී යයි.

එම දෙවසර තුල දී, අගමැති, කල් පවත්නා සාමයක් සඳහා සැබෑ අවස්ථාවක් උදා කරන සටන් විරාමයක් ද එල නෙලා ගැනීමට ඔන්න මෙන්න තිබූ ආර්ථික පුනර්ජීවනයක ප්‍රථම සංඥාවන් ද අප වෙත ගෙන ආවේ ය.

එවිට පරන පන්නයේ දේශපාලනය ඉස්මත්තට පැනගත් අතර බල ලෝභය යලිත් වරක් එලඹුනි.


මා විශ්වාස කරන්නේ ශ්‍රී ලංකාවේ ජනතාවට එම ක්‍රමය වෙනස් කිරීමට අවශ්‍ය බවයි. දේශපාලනඥයන් ජනතාවගේ සේවකයන් වීමත් මැදහත්භාවය දේශපාලන ක්ෂේත්‍රයට පිවිසීමත් ඔබ පතන බවයි.

අප ඉදිරියේ දීර්ඝ අසීරු අරගලයක් පවතී. එය ජයගත හැක්කේ ඔබට පමනි. ඔබට එක්කෝ මැදහත්භාවය සඳහා ඡන්දය දිය හැකි ය. නැත හොත්, කොතැනක හෝ සිටින අන්තවාදීන්ට ජයගැනීමට ඉඩ දිය හැකි ය.

මෙම තීරනාත්මක මැතිවරනයේ දී ඔබ මැදහත්භාවය සඳහා ඡන්දය පාවිච්චි කරනු ඇතැයි ද යන්තම් පටන් ගැනීමට හැකි වූ කර්තව්‍යයන් කරගෙන යාමට අගමැතිතුමාට සහයෝගය දෙනු ඇතැයි ද මම බලාපොරොත්තු වෙමි.

මිලින්ද මොරගොඩ,
කොලඹ දිස්ත්‍රික්කයේ එජාපෙ අපේක්ෂක,
ශ්‍රී ලංකාව

**විජේ ඩයස්ගේ පිලිතුර:**



හිතවත් මොරගොඩ මහතානෙනි.

මෙය ලියන්නේ ඔබ *ලෝසවෙඅ* වෙත එවූ ඊ-මේල් පනිවිඩය ලැබුනු බව දැනුම්දීමටයි.

අප වෙත මෙම පනිවිඩය එවීමේ දී, ඔබ, ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප), මැතිවරනයේ දී එජාපෙ සමග සහයෝගීව කටයුතු කරන නව සමසමාජ පක්ෂය (නසසප) ද ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ පොදු පෙරමුන (පොපෙ) සමග සහයෝගී වන ලංකා සමසමාජ පක්ෂය (ලසසප) ද පන්නයේ පක්ෂයකැයි යන මිථ්‍යාව යටතේ කටයුතු කරන බවක් පෙනී යයි. සමාජවාදී සමානතා පක්ෂය වර්ධනය වී ඇත්තේ, මෙම පක්ෂ දෙකටත් ඔවුන් යෙදී සිටින අවස්ථාවාදී දේශපාලනයටත් එරෙහි ක්ෂමාවිරහිත අරගලයක් තුලිනි. ඒ අනුව ගත් කල, ඔබගේ සත්කාරය යොමු කොට ඇත්තේ මුලුමනින්ම වැරදි තැනකටය. අපි, ඔබගේ වත් ඔබ පක්ෂයේ වත් මිතුරෝ නො වෙමු.

එසේ කියමින් ම, ඔබගේ ඊ-මේල් පනිවිඩය අපි සාදරයෙන් පිලිගනිමු. ඒ මක් නිසා ද යත්, ශ්‍රී ලංකාවේ

මහජනතාව මුහුන දී සිටින ඛේදනීය තත්වය සම්බන්ධයෙන් ඔබ හා ඔබ පක්ෂය වන එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) මෙන් ම පොදු පෙරමුනත් දරන වගකීම පැහැදිලි කිරීමේ අවස්ථාවක් අපට එමගින් ලැබෙන නිසා ය.

1948 නිදහස ලැබුනු දා පටන් වසර 56 ක් තිස්සේ, ශ්‍රී ලංකාව පාලනය කරනු ලැබුවේ, ප්‍රධාන ධනපති පක්ෂ දෙක විසිනි. එනම්, එජා පෙරමුනේ ප්‍රධාන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ විවිධ අවස්ථාවන්හි දී සෙසු පක්ෂ, වඩාත්ම ප්‍රකට ලෙස ලසසප, සමග ඒකාබද්ධ වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) විසිනි. මෙම පක්ෂ, යුද්ධයත් එහි ප්‍රතිවිපාකත් සම්බන්ධයෙන් සෘජුවම වගකිව යුතු ය.

ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූව, ආරම්භයේ පටන්ම, සිංහල වර්ගවාදයට ඇනුවත්වම උඩගෙඩි දුන්නේ ය. ධනවත් අතලොස්සකට පමනක් වාසි ගෙනදුන් වැඩපිලිවෙල ක්‍රියාවට දමනු වස් කම්කරු පන්තිය ජනවාර්ගික රේඛා ඔස්සේ භේද කරලීම ඔවුන්ගේ එල්ලය විය. දේශීය ධනපති පන්තිය කලඑලි බැසීමට බොහෝ කලකට පෙරම, කම්කරු පන්තිය කරලියට පිවිස සිටියේ ය. බ්‍රිතාන්‍ය විජිතවාදී ආයෝජකයන්ගේ පාලනය යටතේ තිබූ වතුකරයේ සහ වානිජ හා කාර්මික ක්ෂේත්‍ර තුල කම්කරුවන් ක්‍රියාකාරී සමාජ බලවේගයක් වීම යන කාරනාව මගින් පැන නංවන ලද මාරක බිය විසින්, මෙම ජාතික ධනපතියන් මෙහෙය වනු ලැබුවේ, සහයෝගය පතා ආචීර්න කල්පික බෞද්ධ සංස්ථාපිතය වෙත හැරෙමින්, ජනවාර්ගිකව භේදකාරී ජාතිවාදී දේශපාලනයෙහි නිරතවීම කරා ය.

ඉන්දියානු සම්භවයක් සහිත වතු කම්කරුවන්ගේ පුරවැසි අයිතිය අහෝසි කිරීමත් සමග ඇරඹුනු, දෙමල ජනයාට එරෙහි වෙනස්කම් කිරීම්, 1956 දී "සිංහල පමනක්" රාජ්‍ය භාෂාව ලෙස තහවුරු කිරීමත් සමග, දේශීය දෙමල ජනයා දක්වාම පුලුල් කෙරුනි. මෙම ප්‍රතිගාමී සිංහල අධිපතිවාදී පිලිවෙත, ප්‍රධාන ධනපති පක්ෂ දෙක ම විසින් වැලඳගැනීම සිදු වූයේ, සිංහල හා දෙමල කම්කරුවන් ඒකාබද්ධව, එජාප තන්ත්‍රය බිඳවැටීමේ අද්දරටම ගෙන ආ, 1953 හර්තාලයෙන් පසුව වීම අහම්බයෙක් නො වේ.

සුලුතර ජන කන්ඩායම්වලට එරෙහිව වෙනස්කම් කිරීමේ මෙම පිලිවෙත ඉදිරියට ගෙන යමින්, 1972 දී සම්මත කල ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මගින් බුද්ධාගම රාජ්‍ය ආගම බවට පත් කෙරුනි. ඔබත් ඔබේ අගමැති රනිල් වික්‍රමසිංහත් අයත් පක්ෂය වන එජාපයේ නායකයා ලෙස ජේ.ආර්. ජයවර්ධන, 1983 දී දෙමල ජනයාට එරෙහි සිවිල් යුද්ධයක් බවට වර්ධනය කලේ, ප්‍රධාන ධනපති පක්ෂ දෙකම විසින් පොදුවේ බෙදාහදාගත්, මෙම සිංහල-බෞද්ධ වර්ගවාදී පිලිවෙත යි.

එහෙත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව විසින් නියම කෙරුනු, "විවෘත වෙලඳ පොල" ආර්ථික පිලිවෙත් ක්‍රියාවට දැමීමට එරෙහි, කම්කරුවන්ගේ හා ගම්බද ජනයාගේ අරගල මැඩීමේ විධික්‍රමයක් ලෙස දකින ලද, දෙමල විරෝධී සිවිල් යුද්ධයට, එහිම තර්කනයක් පැවතුනි. 20 අවුරුදු යුද්ධය, බෞද්ධ සංස්ථාපිතය ඇතුලු සිංහල ස්වෝත්තමවාදී කොටස් ශක්තිමත් කලා පමනක් නො ව, රාජ්‍ය යන්ත්‍රයත් මිලිටරියත් තුල, යුද්ධය ඉදිරියට ගෙනයාම සමග ස්වකීය සමාජ තත්වය හා ධනය වඩවඩාත් බැඳුනා වූ, ස්ථරයක් නිර්මානය කිරීමට ද දායක විය.

ආන්තික සිංහල ස්වෝත්තමවාදී දේශපාලන බලවේග දෙකක් මෙම වර්ධනයන්ගෙන් වාසි ලබා ඇත. එකක්, දැන් ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ නායකත්වයෙන් යුත් ශ්‍රීලනිප සමග සන්ධානගතව සිටින ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වන අතර අනික මෙම මැතිවරනයේ දී අපේක්ෂකයන් වසයෙන් බෞද්ධ භික්ෂූන් 260ක් ඉදිරිපත් කොට ඇති ජාතික හෙල උරුමයයි.

එජාපෙ ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග අත්සන් කල සටන් විරාම ගිවිසුමටත් ඉන් අනතුරුව පවත්වාගෙන ගිය සාම සාකච්ඡාවන්ටත් වල කැපීමට, ජනාධිපති කුමාරතුංග ආරම්භ කල ක්‍රියාවන් මගින්, මෙම ජාතිවාදී පක්ෂ දෙක ශක්තිමත් වූ බව නිසැක ය. ශ්‍රීලනිප සමග සන්ධානයක් තනාගැනීමට අවශ්‍ය වූ ජවිපෙ, කුමාරතුංගගේ විධායක බලතල යොදාගෙන හිතුවක්කාරී ලෙස පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ඇයට බල කරමින්, ඇයගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවන්ට සහයෝගය දුනි. කුමාරතුංග ඔවුන්ගේ ඉල්ලීමට එකග වී, එලඹෙන මැතිවරනයට තරග කරනු පිනිස, ජවිපෙ සමග එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) ලියාපදිංචි කර ගත්තා ය.

කුමාරතුංග, කඩා වැටෙන සිය දේශපාලන ප්‍රතිරූපයට මුක්කු ගසා ගනු පිනිස, උමතු සිංහල ස්වෝත්තමවාදී බලවේග යොදාගෙන ඇති බව පැහැදිලි ය. එහෙත්, එජාපෙ ආන්ඩුව මෙම බලවේග විසින් මතු කර ඇති දේශපාලන තර්ජනයට අභියෝග කලේ නැත. ඒ මක් නිසා ද යත්, ඔබේ පක්ෂය ද, එය තුලට කාවැදී එහි ආධාරකරු පදනම තර කරන, සිංහල වර්ගවාදීන් වැලඳ ගෙන ඇති නිසා ය.

යුද්ධය අවසන් කිරීමේ වැඩපිලිවෙලක කොටසක් ලෙස, කුමාරතුංග විසින් ඉදිරිපත් කරන ලද, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරන පැකේජය කඩාකප්පල් කිරීම පිනිස, 2000 දී, ඔබ පක්ෂය ජවිපෙ සමග එක් වූ බව කවුරුත් දන්නා කාරනාවකි. එයින් පැන නැංවුන දේශපාලන අර්බුදයේ ප්‍රතිඵල ලෙස පැවති මැතිවරනයේ දී, යුද බෙරය වැයුවේ එජාපයයි. කෙසේ වෙතත්, එය පරාජයට පත් විය. ඉන් වසරකට පසුව, ඇමරිකාවේ බුෂ් ආන්ඩුව, ත්‍රස්තවාදයට එරෙහි ඊනියා භූගෝලීය යුද්ධයේ ප්‍රථම ඉලක්කය ලෙස, ඇෆ්ඝනිස්ථානය ආක්‍රමනය කල විට, වොෂිංටනයෙන් නියම කෙරුනු පිලිවෙත අනුව යාමට එජාපය තීන්දු

කලේ ය. ඒ අනුව, යුද්ධය නතර කිරීමට ප්‍රයත්න දැරීමටත් දකුනු ආසියානු කලාපය තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මූලෝපායික අවශ්‍යතාවන්ට සේවය කිරීමෙහි ලා සිය කොටස ඉටු කිරීමටත් එය කැමති විය. ඔබ සමග සමීපව බැඳී ඇති ව්‍යාපාරික හා මූල්‍ය ආයතන ද "සාමය" ඉල්ලා සිටියේ ය.

මහ බලවතුන්ගේ නිහඬ සහයෝගය සහිතව, මහ ව්‍යාපාරිකයන් විසින් සංවිධානය කරන ලද, පාර්ලිමේන්තු කුමන්ත්‍රනයක් මගින්, කුමාරතුංගගේ පොදු පෙරමුනු ආන්ඩුව බිඳ හෙලන ලද්දේ, මෙම කොන්දේසි යටතේ ය. වසරක් තුල පාර්ලිමේන්තුව විසුරුවා, 2001 දෙසැම්බර් මහ මැතිවරනය කැඳවීමට කුමාරතුංගට බල කරමින්, ප්‍රධාන ඇමතිවරු ගනනාවක් පිල් මාරු කොට එජාපයට එක් වූහ. එජාපයේ නායකත්වය යටතේ පිහිටුවන ලද එජාපෙ ආන්ඩුව බලයට ආවේ එම මැතිවරනයෙනි.

යුද්ධය අවසන් කිරීම පිලිබඳ එජාපෙ තීන්දුව, දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ මොන යම් හෝ උත්සුකතාවකින් පැන නැංගා නො වේ. එමෙන් ම, ඔබ අඟවන පරිදි, මහජනතාව සාමයේ ප්‍රතිලාභ නෙලා ගත යුතු ය යන අභිප්‍රායෙන් එය පැනනැංගා ද නො වේ. එය වනාහි, දිවයිනේ හා දකුනු ආසියානු කලාපයේ ලාභ ශ්‍රමය සහ ස්වභාවික සම්පත් ගසාකෑම සඳහා ඇසගසා ගෙන සිටි, ජාත්‍යන්තර ආයෝජකයන්ගේ ලාභ අවශ්‍යතාවන්ට පැවති බාධකයන් ඉවත් කිරීම පිනිස, ගනු ලැබූ හුදු උපායාත්මක පියවරක් පමනි.

රනිල් වික්‍රමසිංහගේ ආන්ඩුව විසින් ආර්ථික පුනර්ජීවනයක් හා සාමයක් ගෙනඑනු ලැබූ බවත් "එහි ප්‍රතිලාභ නෙලා ගැනීමට ඔන්න මෙන්න තිබූ අවස්ථාවක් පැවති" බවත්, ඔබගේ ලිපියේ දී, ඔබ සඳහන් කරයි.

ඊනියා සාමයේ ප්‍රතිලාභ ලැබී ඇත්තේ කාහට ද යන වග, පහත දැක්වෙන සංඛ්‍යා ලේඛන මගින් පෙන්නුම් කෙරේ. නව අධි-තාක්ෂන අවි මිලදීගැනීමත් මිලිටරියට අලුතෙන් බඳවාගැනීමත් හේතු කොට ගෙන, 2002 වසර තුල දී ආරක්ෂක වියදම් දිගටම ඉහල නැගි අතර, සමාජ සේවාවන්ට කෙරුනු වියදම් දරුනු ලෙස කප්පාදු කෙරුනි.

නිදහස් අධ්‍යාපනය සඳහා අයවැයෙන් වෙන් කල ප්‍රතිපාදන, 2002 දී දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.5 සිට 2.3 දක්වා කප්පාදු කෙරුනි. මෙහි ප්‍රතිඵලය වූයේ ගම්බද ප්‍රදේශවල පාසල් 400කට වඩා වසා දැමීමයි. නිදහස් සෞඛ්‍ය සේවය සඳහා වෙන් කල මුදල් ද එම වසර තුලදීම දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.7 සිට 1.5 දක්වා පහත වැටුනි. වෛද්‍යවරයකු හමුවී ප්‍රතිකාර නියම කරවාගැනීමට පමනක්, දැන් කම්කරුවකුගේ දිනක වැටුපට වඩා වැඩි මුදලක් වැය වේ.

ආන්ඩුවේ සහනාධාරය ඉවත් කිරීම හේතුවෙන්, පොහොර සඳහා කලින් ප්‍රමානය මෙන් තුන්ගුනයක් ගෙවීමට දුගී ගොවීන්ට සිදුව ඇත. මේ වනාහි, සාමයේ සහ "නෙලා ගැනීමට ඔන්න මෙන්න තිබූ ප්‍රතිලාභවල" කවරය යටතේ එජාපෙ ආන්ඩුව විසින් වැඩ කරන ජනතාවට එරෙහිව එල්ල කරන ලද ප්‍රහාරවලින් සමහරක් පමනි. මොන තරම් ප්‍රෝඩාවක් ද?

අනෙක් අතට, ජාත්‍යන්තර ආයෝජකයන් සමග එක්වී සිටින, දේශීය මහ ව්‍යාපාරික සංගත කිහිපයක, ව්‍යාපාරික ගිනුම් විස්තර මගින් එලිදරව් කෙරෙන පරිදි, එජාපෙ ආන්ඩුව සැබැවින්ම නියෝජනය කරන ධනවත් අතලොස්ස, තවත් තර වී සිටිති.

ශ්‍රී ලංකාවේ දැවැන්තම සමූහ ව්‍යාපාර සමාගම්වලින් එකක් වන, හේලීස් ආයතනය, පසුගිය වසරේ මුල් කාර්තු තුන සඳහා බදු ගෙවීමෙන් පසු ලද ලාභය ලෙස රුපියල් මිලියන 605.3ක් වාර්තා කලේය. එයින් ධනවත් කොටස්කරුවන් අතර රුපියල් මිලියන 367ක් බෙදාදීමට නියමිත ය.

තවත් කාර්මික හා බැංකු සමූහ ව්‍යාපාරයක් වන සේලාන් බැංකු සමූහය, 2003 වසරේ දී බදු ගෙවීමෙන් පසු රුපියල් මිලියන 1,026ක් උපයාගෙන ඇත. සේලාන් මවු සමාගමේ අධ්‍යක්ෂ ජෙනරාල්, අර්න් පැස්කුවල්ට අනුව, සේලාන් බැංකුවේ ලාභ කොටස රුපියල් මිලියන 699ක් විය.

ඩීඑෆ්සීසී බැංකුව, පසුගිය වසරේ මුල් මාස නවය තුල, පෙර වසරේ එම කාල පරිච්ඡේදයට සන්සන්දනාත්මකව, සිය ලාභය සියයට 16කින් ඉහල දමා ගති.

හැටන් නැෂනල් බැංකුව, පසුගිය වසරේ දී, බදු ගෙවීමට පෙර රුපියල් මිලියන 1,092ක ලාභයක් ද බදු ගෙවීමට පසු රුපියල් මිලියන 1,008ක ලාභයක් ද වාර්තා කලේය.

මෙම පිලිතුර අනවශ්‍ය ලෙස දිගු නො කරනු පිනිස, මීට සමානව ලාභ පොදිගසා ගෙන ඇති තවත් බොහෝ සමාගම් පිලිබඳ සඳහන් කිරීමෙන් අපි වැලකීගන්නෙමු. වැඩ කරන ජනතාව අන්ත දරිද්‍රතාවයේ ගිලී සිටින අතරතුර, ඔබගේ පක්ෂයේ පාලනය යටතේ, පසුගිය දෙවසර තිස්සේ, ධනවත් අතලොස්සක් "සාමයේ ප්‍රතිලාභ නෙලා ගෙන" ඇත්තේ මෙලෙස ය.

ඉතින්, මෙහි සමාජ ප්‍රතිවිපාක මොනවාද? ශ්‍රී ලංකාව, පසුගිය වසරේ දී, සිය දිවි නසා ගැනීමේ ඉහලම අනුපාතිකය කරා ලඟා වෙමින්, ලෝකයේ සිය දිවි නසා ගැනීමේ අගනගරය ලෙස, කුප්‍රකට නමක් දිනාගෙන ඇත.

වසර දෙකකට ආසන්න කාලයක් තිස්සේ දිගට ඇදී ගිය සාම ක්‍රියාදාමය, අවතැන් ගත වූ දෙමල ජනයාට, සිය පැරනි ඉඩකඩම් හා නිවාස කරා ආපසු යාමට ඉඩදීමේ, අතිමූලික පියවර ගැනීමට වත් සමත්ව නැත. යාපන අර්ධද්වීපයේ භූමි ප්‍රදේශයෙන් තුනෙක් පංගුවකට ද වඩා වැඩි කොටසක් වාඩිලාගෙන, එම ඉඩම්වල යුක්තියුක්ත හිමිකරුවන් පලවා හැර, පිහිටුවා

ඇති අධි ආරක්ෂිත කලාපවලින් මිලිටරිය ඉවත් කරගැනීම පවා, එජාපෙ ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කර ඇත.

එපමනක් නොව, උතුරේ හා නැගෙනහිර පිහිටුවීමට නියමිත අන්තර් පාලනයක් වෙනුවෙන්, ඔබගේ ආන්ඩුව සකසා ඇති සැලසුම්, අතිශයින්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී හා ජාතිවාදීව භේදකාරී ය. එජාපෙ විසින් යෝජනා කර ඇති, තෝරා පත් කර නොගැනෙන මන්ඩලය, සමන්විත වීමට නියමිතව තිබුනේ, සිංහල, මුස්ලිම් හා එල්ටීටීඊය යන පාර්ශ්වයන් විසින් නම් කෙරුනු පුද්ගලයන්ගෙනි. මෙහි දී එල්ටීටීඊයට බහුතරයක් හිමි වනු ඇත. මෙය වනාහි ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමේ සැලසුමක් නොව, උත්සන්න කෙරුනු භාතෘභාරක යුද්ධයකට පාර කපමින්, ජාතිවාදී ආතතීන් ඉහල දැමීමේ සැලැස්මකි. එවන් ගැටුමක්, ශ්‍රී ලංකා මිලිටරිය තව දුරටත් මැදිහත්කරවීම සඳහා යොදාගැනෙනු නියත ය.

ඔබ, "සාම ක්‍රියාදාමය" හා "ආර්ථික ප්‍රතිසංස්කරන" පිලිබඳව කටයුතු කරන, එජාපෙ කැබිනට් මන්ඩලයේ ප්‍රධාන සාමාජිකයකු ලෙස, අගමැතිට පමනක් දෙවැනි වෙමින්, ආන්ඩුවේ සියලු තීන්දු සම්බන්ධයෙන් මූලික කාර්යභාරයක් ඉටු කොට ඇත. දැන්, "දේශපාලන ක්‍රමයේ සංස්කෘතිය වෙනස් කිරීමට සහාය දීමේ ප්‍රයත්නයක් ලෙස" මීට දෙවසකට ඉහත දී දේශපාලනයට පැමිනි බව කියා සිටින ඔබ, ඔබට හා ඔබේ පක්ෂයට දෙන ඡන්දයක් "මැදහත්භාවය සඳහා දෙන ඡන්දයක්" යයි කියාපායි.

තවත් ප්‍රෝඩාවක්! ඔබ, රැස්වීම් ගනනාවක්, විශේෂයෙන් ම එක්සත් ජනපද නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රිචඩ් ආර්මිටේජ් සමග, පවත්වමින්, වොෂිංටනයේ ආන්ඩුවත් ලංකාවත් අතර සමීප දේශපාලන හා මිලිටරි සබඳතා ස්ථාපිත කරගනු පිනිස, එජාපෙ ආන්ඩුව වෙනුවෙන්, බ්‍රෝකර්වරයකු ලෙස ක්‍රියා කොට ඇති බව කවුරුත් දන්නා කරුනකි. තවද, වොෂිංටනයේ ආඥාවන් මත ක්‍රියා කරමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියමයන්ට අනුව එජාපෙ විසින් සූත්‍රගත කෙරුනු, "යලි පුබුදමු ශ්‍රී ලංකා" වැඩපිලිවෙල ක්‍රියාවට දැමීමට මාවත සකසාගනු පිනිස, එජාපෙ ආන්ඩුවත් ජනාධිපති කුමාරතුංගත් අතර සම්බන්ධීකරනය සඳහා ඔබ ක්‍රියාත්මක වී තිබේ.

එජා පෙරමුනේ සමස්ත ආර්ථික වැඩපිලිවෙලත්, එමෙන් ම අලුතෙන් පිහිටුවන ලද චන්ද්‍රිකා කුමාරතුංගගේ එජනි සන්ධානයේ ආර්ථික වැඩපිලිවෙලත් ඉලක්ක කොට ඇත්තේ, සියලු වැඩ කරන ජනතාවගේ රැකියාවන්ට, සුබසාධන සේවාවන්ට හා ජීවනෝපායන්ට එරෙහි ප්‍රහාර උත්සන්න කිරීම මගින්, මූල්‍ය ප්‍රාග්ධනයේ අවශ්‍යතා සඳහා සේවය කිරීමයි. මෙම වැඩපිලිවෙල ක්‍රියාවට දමන ඕනෑම ආන්ඩුවක් යටතේ, සමාජ ධ්‍රැවාන්තගතවීම වර්ධනය වීමට නියමිත බැවින්, ධනපති පක්ෂ දෙකම යොමු වනු ඇත්තේ, කම්කරු පන්තියට හා දුගී ජනයාට එරෙහිව ආඥාදායක පාලනයක් පිහිටුවීම දෙසට ය. තමන්ට පූර්න සහයෝගය දෙන පාර්ශ්වයක් ලෙස එජාපෙ පුරසාරම් දෙඩූ බුෂ් ආන්ඩුව, මෙම ආඥාදායක පියවර සඳහා සිය අනුමැතිය සංඥා කොට ඇත්තේ, අප්‍රේල් 2 දායින් පසුව තේරී පත් වන ඕනෑම ආන්ඩුවක් සමග වැඩ කිරීමට තමන් සූදානම් බව පැවසීම මගිනි.

"මධ්‍යස්ථ දේශපාලනයේ" වකවානුව දේශීයව හා ජාත්‍යන්තරව සදහටම අවසන් වී ඇත.

ආරම්භයේ පටන්ම, දෙමල ජනයාට එරෙහි යුද්ධයට විරුද්ධ වූ ද උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා මිලිටරිය කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි උද්ඝෝෂනය කලා වූ ද එකම පක්ෂය, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය යි. ඔබ කතා කරන, කල් පවත්නා සාමය, සඳහා පූර්ව-අවශ්‍යතාව මෙයයි. එහෙත් එජාපෙ හා සෙසු ධනපති පක්ෂ තදබල ලෙස විරුද්ධ වන්නේ ද එයටයි.

අපි, පීඩිත සුලුතරයන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පාගමින්, සිංහල-බෞද්ධ ඒකීය රාජ්‍යය පවත්වාගෙන යාමේ සියලු බලහත්කාරී ප්‍රයත්නයන්ට විරුද්ධ වන අතරම. එල්ටීටීඊය ද ඇතුලු, ජනවාර්ගිකව පදනම් වූ සෑම කන්ඩායමකම භේදකාරී ජාතිවාදී වැඩපිලිවෙලවල්වලට එරෙහිව ද සටන් වදිමු.

කල් පසු වූ, ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ ගැටලු විසඳාලීම, අව්‍යාජ සමාජ සමානතාව තහවුරු කිරීම සමග අත්‍යන්තයෙන් ම බැඳී තිබේ. මේ විසඳුම සඳහා පීඩිත මහජනතාවගේ සහාය ඇතිව, කම්කරු පන්තිය දේශපාලන බලය ගැනීම ඉල්ලා සිටී.

ඔබත්, ඔබ නියෝජනය කරන පාලක ප්‍රභූවත් නිර්මානය කර ඇති ව්‍යසනයෙන් ගොඩ ඒමේ එකම මාවත එයයි, මොරගොඩ මහතානෙනි. යලිදු වරක්, ඔබගේ ඊ-මේල් පනිවිඩය වෙනුවෙන් ඔබට ස්තුති කරමි. ඒ මක් නිසා ද කිය තොත්, ඉදිරි මාවතක් සොයමින් සිටින, සිංහල හා දෙමල ජනවර්ග දෙකටම අයත්, සියලු කම්කරුවන්ට, තරුනයන්ට, ගම්බද දුගීන්ට හා බුද්ධිමතුන්ට, මෙම කරුන, පැහැදිලි කරනු පිනිස, එය අපට අවස්ථාවක් සපයා දුන් බැවිනි.

හිතවත්,

විජේ ඩයස්.

සසප ප්‍රධාන ලේකම්.

© www.wsws.org